**රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව**

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ
ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ (PL1) විවෘත
බඳවා ගැනීම් සඳහා අයදුම්පත් කැඳවීම - 2026

**1.0** **රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ තනතුරුවල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**2.0** **රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ තනතුරුවල පවත්නා පුරප්පාඩු පහත වගුවෙන් දැක්වේ :-**

| *අනුමත තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| වැඩ සහායක | 10 |

**3.0** **වැටුප් පරිමාණය :-**

3.1. **වැටුප් කේත අංකය** - PL 1- 2025
3.2. **වැටුප් පරිමාණය** - රු. 40000 /- - 10 x 450-10 x 490 -10 x540-12 x590= රු. 61,880/-

*සටහන* - (I) රා.ප.ච 10/2025 හි උපලේඛන III අනුව 2027.01.01 දක්වා වැටුප් ගෙවන අතර, 2027.01.01 දින සිට උපලේඛන II අනුව වැටුප් ගෙවීම සිදුකරනු ඇත.

(II) මෙයට අමතරව රජයේ නිලධාරින් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාද ඔබට හිමිවේ.

3.3 **වැටුප් ක්‍රමය** :-

| *ශ්‍රේණිය* | *ආරම්භක වැටුප් පියවර* | *ආරම්භක වැටුප් තලය (රු.)* |
|---|---|---|
| III | පියවර 01 | රු.40,000/- |
| II | පියවර 12 | රු. 44,990/- |
| I | පියවර 22 | රු. 49,940 /- |
| විශේෂ | පියවර 32 | රු. 55,390 /- |

**4.0** **තනතුරෙහි / තනතුරුවල ස්වභාවය** : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

**5.0** **බඳවා ගැනීමේ ශ්‍රේණිය**: III ශ්‍රේණිය

**6.0** **භාෂා මාධ්‍යය** : සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යය

**7.0** **පැවරෙන කාර්යය භාරය:-**

| *අනුමත තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|
| වැඩ සහායක | සේවා ස්ථානය පවිත්‍ර කිරීම, ද්‍රව්‍ය ප්‍රවාහනයේදී උදව් කිරීම, කාර්මික මහතුන්ගේ නිෂ්පාදන හා සේවා කටයුතු වලදී අත්උදව් සැපයීම ඇතුළුව අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරීන් |

**8.0** මෙම පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් ය. පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය දීර්ඝ කිරීමට හෝ පත්වීම අවසන් කිරීමට පත්වීම් බලධරයා හට බලය ඇත.

**9.0 සුදුසුකම් :-**

**(I). අධ්‍යාපන සුදුසුකම් :**
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම.

**(II). වෘත්තීය සුදුසුකම් :** අදාළ නොවේ.

**(III). පළපුරුද්ද :** අදාළ නොවේ.

**(IV). කායික සුදුසුකම් :** සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

**(V). වෙනත් :**
I. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.
II. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය අංක 09 සිට 10 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* සඳහන් වන 2026.11.06 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**10.0 වයස** :- අයදුම්පත් කැඳවන අවසන් දිනට අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතු ය.

**11.0 බඳවා ගැනීමේ ක්‍රමය** :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙලින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවාගනු ලැබේ.

**11.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *ලකුණු ලබාදෙන ආකාරය* | *ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 | අ.පො.ස (උසස් පෙළ) විභාගයේ සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර එක් සමත් විෂයයකට ලකුණු 4 බැගින් | 12 |
| | | පිළිගත් ආයතනයක වසරකට නොඅඩු ඩිප්ලෝමා හෝ ඊට සමාන හෝ ඉහළ සුදුසුකම් ලබා තිබීම | 08 |
| | | පිළිගත් ආයතනයක මාස 6 - වසර 1 අතර සහතික පත්‍ර පාඨමාලා සඳහා | 06 |
| | | පිළිගත් ආයතනයක මාස 3 - මාස 6 අතර සහතික පත්‍ර පාඨමාලා සඳහා | 04 |
| වෘත්තීය සුදුසුකම්/ පුහුණු පාඨමාලා | 25 | NVQ 2 මට්ටමේ සුදුසුකම් ලබා තිබීම | 05 |
| | | NVQ 3 මට්ටමේ සුදුසුකම් ලබා තිබීම | 08 |
| | | NVQ 4 මට්ටමේ හෝ ඉහළ සුදුසුකම් ලබා තිබීම | 12 |

| | | | |
|---|---|---|---|
| සේවා පළපුරුද්ද | 30 | රජයේ හෝ පෞද්ගලික ආයතනයක වැද්දුම්, පෑස්සුම්, යන්ත්‍රන,වාත්තු, වඩු කාර්මාන්ත ආදී වූ යාන්ත්‍රික ඉංජිනේරුමය ක්ෂේත්‍රවල සේවා පළපුරුද්ද සඳහා එක් වසරකට ලකුණු 05 බැගින් | 30 |
| විෂය බාහිර ක්‍රියාකාරකම් | 10 | ක්‍රීඩා සහතික සඳහා පළාත් මට්ටමේ ජයග්‍රහණ සඳහා ලකුණු 3 ක් ද, සමස්ථ ලංකා මට්ටමේ ජයග්‍රහණ සඳහා ලකුණු 5ක් ද (1 ක් හෝ වැඩි ප්‍රමාණයක් සඳහා) පාසලේ ශිෂ්‍ය නායක තනතුරු සඳහා ලකුණු 02 ක් හිමි වේ. | 10 |
| සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වන කුසලතාවය | 05 | සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාවය අනුව ලකුණු ලබා දේ. | 05 |
| එකතුව | | | **100** |

*සටහන.* - තනතුරට ලබා ඇති පළපුරුද්ද පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතු ය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතු ය.

**12.0** රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

**13.0** ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේ දී යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු /ඇය රජයේ සේවයෙන් පහ කළ හැක.

**14.0** නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**15.0** අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්වයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

**16.0** මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

**17.0** අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් ඉදිරිපත් කළ යුතු ය :-

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
II. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය;
III. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**18.0** මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

**19.0** ඉල්ලුම් කළ යුතු පිළිවෙල :

සියලු විස්තර ඇතුළත් කරමින් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද සනාථ කරන සහතිකවල පිටපත්ද සමග **2026.11.06** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **"අධ්‍යක්ෂ ජනරාල්, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, කොළොන්නාව පාර, කොළොන්නාව."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහල කෙලවරේ **" ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III වන ශ්‍රේණියට විවෘත බඳවා ගැනීම - (2026) "** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

**ඉංජි.එස්.එන්.බී.එම්.පද්මසිරි,**
අධ්‍යක්ෂ ජනරාල්.

2026 ඔක්තෝබර් මස 09 දින,
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව,
කොළොන්නාව පාර,
කොළොන්නාව.